ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 ඔක්තෝබර් 28 සඳුදා
05 වෙළුම - 52 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## ලෝක ළමා දිනය සමරමින්

# ළමා ලොව විසිතුරු කළ අවිහිංසක සිනා...

Photo By: Thilina Alahakoon CCP

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# "මළවුන්" සැමරීම හා " හැලොවීන්" දැන ගැනීම (තවත් ආවර්ජනයක්)

## ආදරණීය දුවේ පුතේ...

අද අපි කථා කරන්න යන්නෙ ඔක්තෝබර් 31 වනදාට සාමාන්‍යයෙන් සැමරෙන දිනයක් පිළිබඳවයි. මේ දිනය සම්බන්ධයෙන් පෙරදිග රටවල එතරම් තේරුම් ගැනීමක් නොතිබුණත් බටහිර රටවල නම් මෙම දිනය ප්‍රසිද්ධ දිනයක්. විශේෂයෙන්ම කුඩා ළමුන් අතර ඉතාම ජනප්‍රිය දිනයක්. මේ දිනය හැලොවීන් දිනය (Halloween) නමින් නම් කිරීමට හේතු කිහිපයක්ම බලපා තිබෙනවා. පෙර රෝම අධිරාජ්‍ය සමයේ මුලින්ම මෙය මංගල්‍යයක් සේ සැමරුවා. අස්වැන්නට හා ධාන්‍යයට අධිපති දෙවඟනක් වන 'පොමෝනා' ( Pomona ) දෙවඟන සමරන්නට මෙම දිනය යොදා ගත් බව ඒ අතීත කථා සිහිපත් කරනවා. ඒ වගේම මළවුන්ගේ මංගල්‍යය සමරන්නට නැතිනම් "පේරන්තාලියා" (Parentalia ) නමින් නම් කෙරුනු මේ මළවුන් සම්බන්ධ මංගල්‍යය සමරන්නට මෙය මුල් වී තිබෙනවා. බ්‍රිතාන්‍ය හා අයර්ලන්ත රාජ්‍යය න්ට අයත් දූපත් වැසියන් මුලික කොට මෙම මංගල්‍යය සමරන්නට මුල්වී තිබෙන්නේ ගිම්හාන සමය අවසන් වු බව හඟවන්නට ගත් උත්සාහයක් හැටියටයි.

ආදර දුවේ පුතේ, මේ හැලොවීන් කියන නමේ ආරම්භය ගැන කල්පනා කර බලන විට ස්කොට්ලන්ත ආභාෂයක් ඇතිව 16 වන ශත වර්ෂයේ උපත ලත් වචනයක් හැටියට කල්පනා කර බලන්න පුළුවන්. ( All-Hallows - Even ) සියළු සාන්තුවරයන්ගේ මංගල්‍යයට පෙර සැන්දෑව කියන තේරුම අනුව තමයි ස්කොට්ලන්ත ආභාෂය ඇතිව මෙය එක් අතකින් උපත ලබා ඇත්තේ. දැන් අපි බලමු මේ දවසේදී කුඩා දරුවන් මොනවාද කරන්නේ කියලා. පෙර කල පටන් වර්ධනය වෙමින් පැවති මේ මංගල්‍යය පිළිබඳ අදහස හා සැමරීම අද වන විට සම්පූර්ණයෙන්ම කුඩා දරුවන් අත්දකින සැමරීමක් බවට පත්වී තිබෙන බව අවට ලෝකය දිහා බලන විට පැහැදිලියි. විශාල පළතුරු හෝ එළවළු ගෙඩි වලින් ලන්තෑරුම් නැතිනම් බකට් සාදාගෙන මේ හැලොවීන් රාත්‍රියේ වීදී සංචාරය කරමින් ගෙයින් ගෙට යන්නට කුඩා ළමුන් පුරුදු වී තිබෙනවා. වර්ණවත් කල මුහුණු වලින් සහ විවිධ ඇඳුම් මෝස්තර ප්‍රදර්ශනය කරමින් මේ දවසේදී කුඩා ළමුන් සැරසෙනවා. වට්ටක්කා ගෙඩි වලින් සමහර විට නිවෙස් පවා සරසන්නට මේ දවසේදී කුඩා ළමුන් පෙළඹෙනවා. මළවුන්ගේ හා සියළු සාන්තුවරයන්ගේ දිනයන් සැමරීමට පෙර දිනයක් වු ඔක්තෝබර් 31 වන දා මෙම දිනය සැමරීම තුළින් ක්‍රිස්තියානි මංගල්‍යයක ලක්ෂණ මේ වෙනකොට මේ දිනය මුල් කොට ඉස්මතු වී තිබෙනවා. මෙය මංගල්‍යයක් සේ සමරනු නොලැබුවත් සිහිපත් කිරීමේ දිනයක් සේ යොදා ගෙන තිබෙනවා. ඒ අනුව විවිධ ඇඳුම් ආයිත්තම් වලින් සැරසෙන විට ඇටසැකිළි හා අවතාර නිරූපනය කරන ඇඳුම් පැළඳුම්ද දැකිය හැකියි. හරියට ඩ්‍රැකියුලා හෝ මමී ( Dracula or Mummy) යන චරිත පෙන්නුම් කරන ආකාරයේ ඇඳුම් පැළඳ ගැනීමට මේ දිනය සැමරීමේදී කුඩා දරුවන් ප්‍රිය කරනවා.

ආදර දුවේ පුතේ, එයටත් හේතුවක් තියෙනවා. දැන් මේ කුඩා දරුවන් මෙහෙම විවිධ චරිත සේ හැඳ පැළඳගෙන ගෙයින් ගෙට යනවා. එසේ ගොස් ඔවුන් අසන ප්‍රශ්නයක් තිබෙනවා. විජ්ජාවක්ද ? සංග්‍රහයක්ද ? (Trick or Treat ?) මෙහිදී යම් විජ්ජාවක් වැනි බිය ගැන්වීමක් මෙයින් හැඟෙනවා නේද ? ඉතින් වැඩිහිටියෝ පැණි රස කෑම තියාගෙන ඉන්නවා මේ දරුවන් ගෙවල් වලට ආපු විගසම ලබා දෙන්න. සමහර අය මුදල් පවා දෙනවා. හරියට නත්තල් කාලේ කුඩා ළමයින් කැරොල් ගායනය යනවා වගේ. මෙය දැන් ක්‍රීඩාවක් වුනාට මෙයින් ක්‍රිස්තියානි හැඟීමක් ප්‍රබලව ඉස්මතු වෙනවා. කතෝලික හැඟීමක් තිබෙනවා මරණින් පසු ආත්මයන් සැරිසරනවා කියලා. විශේෂයෙන්ම මළවුන්ගේ දිනය සැමරීමට පෙර මේ ආත්මයන් පිළිබඳව ජනතාව වැඩිපුර කල්පනා කරනවා. එදා දුප්පත් ජනතාව ගෙයින් ගෙට ගියේ මේ මළවුන් වෙනුවෙන් යාච්ඤා කරන බවට පොරොන්දු වෙමින් ආහාර ඉල්ලා ගෙනයි. එයත් මෙයට යම් සම්බන්ධයක් තිබෙනවා.

ආදර දුවේ පුතේ, අපි උත්සවයක් වෙනුවෙන් ගෙවල් සරසනවා නේද ? දැන් මේ හැලොවීන් දිනය දවසේදීත් ගෙවල් සරසන්නට ළමුන් පෙළඹෙනවා. හැබැයි විශේෂයක් තිබෙනවා. ඒ තමයි වට්ටක්කා ගෙඩි වලින් විවිධ රූප නිර්මාණය කරලා ඇටසැකිලි, අවතාර වගේ රූපවලින් තමයි මෙදින ගෙවල් සරසන්නෙ. මෙහි කිසිම අද්භූත බියකරු බවක් නැහැ. තිබෙන්නේ අර මළවුන් සැමරීම සංකේතවත් කිරීම පමණයි. ඒ වගේම හැලොවීන් සාද පවා පැවැත්වෙනවා. හැබැයි මෙහිදී විශේෂයෙන්ම කථා කරන්නේ හොල්මන් කථා පිළිබඳවයි. බිය උපදවන චිත්‍රපට කථා, හොල්මන් කථා මේ සාද වලදී කථාවට ලක් වෙනවා. කතෝලික සභාව අදටත් විශේෂයෙන් බටහිර රටවල කුඩා ළමුන් මේ කරන සැමරුම පිළිබඳව යම් අවධානයක් යොමු කරලා තියෙනවා. හානියක් නොවන ආකාරයෙන් මෙම සැමරීම කරන්නට වැඩිහිටියන් පවා දරුවන්ට උදව් වෙනවා. අතීත සිදුවීම අනුව මේ හැලොවීන් දිනය ආරම්භ වී තිබුණත් අද වනවිට සියලු සාන්තුවරයන්ගේ හා මළවුන්ගේ දිනයට සම්බන්ධව හැලොවීන් සැමරීම කරනු ලබනවා. මිථ්‍යාදෘෂ්ටික ආකල්පයක් මෙහි තිබෙන බව සමහර විචාරකයින් පැවසුවත් අද වනවිට ළමුන් සතුටට පත් වන සැමරීමක් නිසා කතෝලිකයන් බොහෝ විට මළවුන් සැමරීමට හා සියලු සාන්තුවරයන් පිළිබඳව ළමුන් වඩාත් දැනුවත් කරන්නට මේ සැමරීම හේතුවක් කරගෙන තිබෙනවා.

ආදර දුවේ, පුතේ, කතෝලික ආභාෂය හා වත් පිළිවෙත් නිවැරදිකළේ අතීත යම් යම් පැවති ආකල්ප බව දැන් ඔබට තේරෙනවා නේද? නිවැරදි දිශානතීන් වටහා ගන්න. ඔබත් දහම නිවැරදිවම අදහාගන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**




## පියාණන් වන දෙවියන් වහන්සේ

❖ **ප්‍ර:** අහස හා පොළොව ද එහි අඩංගු වූ සියල්ල ද මැවුවේ කවු ද?
**උ:** දෙවියන් වහන්සේ ය.

❖ **ප්‍ර:** දෙවියන් වහන්සේ මැවූ වඩා උතුම් මැවිලි මොනවා ද?
**උ:** දෙවියන් වහන්සේ මැවූ වඩා උතුම් මැවිලි නම් දේව දූතයන් හා මනුෂ්‍යයෝ ය.

❖ **ප්‍ර:** දේව දූතයෝ නම් කවුරු ද?
**උ:** ස්වර්ග රාජ්‍යයෙහි දෙවියන් වහන්සේට වන්දනා කිරීමට ද, උන්වහන්සේ සමඟ ප්‍රීති වීමටද, මවනු ලැබූ ශුද්ධවූ ආත්මයෝය.

❖ **ප්‍ර:** දෙවියන් වහන්සේ දේව දූතයන් යහපත්ව මැවූ සේක් ද?
**උ:** උන්වහන්සේ සියලු දේව දූතයන් යහපත්ව මැවූසේක.

❖ **ප්‍ර:** සියලු දේව දූතයෝ නිතොරව යහපත්ව පැවතුණෝද?
**උ:** නැත, සමහරු දෙවියන් වහන්සේට විරුද්ධව පවු කළ නිසා නිරයට හෙළනු ලැබුවෝ ය.

❖ **ප්‍ර:** දෙවියන් වහන්සේට විරුද්ධව පවු කළ නරක දූතයන් ගේ නම කුමක් ද?
**උ:** ඔවුන්ගේ නම යක්ෂයෝ ය.

❖ **ප්‍ර:** යහපත් දේව දූතයෝ දෙවියන් වහන්සේට කෙසේ මෙහෙ කරත් ද?
**උ:** සමහර දේවදූතයෝ දෙවියන් වහන්සේගේ පණිවුඩ ගෙනයමින් ද, අන් සමහරු අප ආරක්ෂා කරමින් ද දෙවියන් වහන්සේට මෙහෙ කරති.

❖ **ප්‍ර:** අප එක එකා ආරක්ෂා කරන දේව දූතයාට අප දෙන නම කුමක් ද?
**උ:** රැකවල් දූතයා ය.

❖ **ප්‍ර:** රැකවල් දූතයා කෙරෙහි ඔබේ යුතුකම් මොනවා ද?
**උ:** රැකවල් දේව දූතයාට ආදරය වීම හා ගෞරව කිරීම ද,එතුමන්ගෙන් උදව් ඉල්ලීමද, එතුමන්ට දුක් නොදීම ද මගේ යුතුකම වන්නේ ය.

❖ **ප්‍ර:** රැකවල් දූතයාට කියන යාච්ඤාව කුමක් ද?
**උ:** ඒ යාච්ඤාව මෙසේ ය:-

මාගේ රැකවල් දේව දූතයෙනි, ඔබ බාරේ ඉන්නාවූ මට අද දින ඔබගේ පරම දයාබර කමින් ඥාන එළිය දී මා රක්ෂා කර නඩත්තු කර ආණ්ඩු කරනවා සොඳේ.

## භාවනා කරමු

### කෝප වී සිටින අවස්ථාවක කරන භාවනාවක්

1. නිහඬ පරිසරයක සුදුසු ස්ථානයක් තෝරා ගන්න.

2. ඔබව කෝපයට පත් කළ සිදුවීම සිහිපත් කරගන්න.

3. එම සිදුවීම තුළින් ඔබගේ සිත රිදවූ පුද්ගලයා හා වචන මතක් කර ගන්න.

4. මෙම පාඨයට අවධානය යොමු කරන්න.''ඔබ පූජාසනය වෙත පඬුරු ගෙනෙන කල ඔබේ සහෝදරයාට විරුද්ධව යම් අමනාපයක් ඇතිව සිටින්නේ නම් පඬුරු පූජාසනය ඉදිරියේ තබා පළමු කොට සහෝදරයා හා සමගි වී පසුව පඬුරු පුදන්න.

5. ඔබව කෝපයට පත් කළ පුද්දගලයාව සිතින් මවා ගන්න. ''මම ඔබට සමාව දෙමි'' කියා සිතින් ඔහුට කියන්න.

6. පහසු ඉරියව්වකට ශරීරය කෙළින් තියාගෙන වාඩිවන්න ඇස් දෙක පියාගන්න.

7. අවට පරිසරයෙන් ඇසෙන ශබ්දවලට සවන් දෙන්න. (කිසි දෙයක් ගැන සිතන්න එපා.)

8. ඔබගේ අවධානය හුස්ම කෙරෙහි යොමු කරමින් මද වේලාවක් රැඳී සිටින්න.

9. හුස්ම රිද්මයට අනුව ඔබව කෝපයට පත් කළ පුද්ගලයාව හිතින් මවාගෙන ''මම ඔබට සමාව දෙමි'' කියා කිහිප වතාවක් කියන්න.

10. පසුව ඔබ මවා ගත් පුද්ගලයාව හා ''මම ඔබට සමාව දෙමි'' යන වචනය කෙරෙහි ඇති අවධානයෙන් මිදී ගැඹුරු නිහඬතාවයකට පත්වන්න. ඔබගේ අවධානය බිඳුනොත් නැවත හුස්ම කෙරෙහි පමණක් අවධානය යොමු කර නැවත ඇතුලාන්ත නිහඬතාවය තුළ රැඳෙන්න.

11. භාවනාව අවසානයේ ජේසුට ස්තුති කර යාච්ඤාවක් හෝ ගීතිකාවක් කියන්න

12. භාවනාව පිළිබඳව පුංචි ඇගයීමක් කරන්න.

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය

# නොවැම්බර් මස 01 වන දිනට යෙදෙන සියළු සාන්තුවරයින්ගේ මංගල්‍යය නිමිත්තෙනි.




## සාන්තුවර ජීවිත ආදර්ශයන් අපගේ දිවිපෙවෙතට එක්කර ගනිමු

ආදර දුවේ පුතේ, අප සභාමාතාව නොවැම්බර් මස පළමුවැනි දින සියළු සාන්තුවරයින්ගේ මංගල්‍යය සමරනු ලබනවා. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය සමග එදා සමාජයේ ජීවත්වුණ අපි වගේ සාමාන්‍ය මිනිසුන් ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරන්න සෑම ආකාරයකින්ම ක්‍රියා කළා. ප්‍රසාද ස්නාපනය නමැති දිවැසි සේවාව අවබෝධකරගෙන, ක්‍රිස්තු ජීවිතයට සාක්ෂිදරමින් ප්‍රාණපරිත්‍යාග වූ පිරිස අපි ශුද්ධවන්තයන් ලෙස හඳුන්වනු ලබන්නෙමු.

සෑම ශුද්ධවන්තයෙකු, ශුද්ධවන්තියක තුළම කැපී පෙනෙන සුවිශේෂ ලක්ෂණ රාශියක් ඇත. ලොව පුරා විහිදී ඇති කතෝලික සභාවේ සහ අන්‍ය ලබ්ධිකයින්ගේ ගෞරව භක්තිප්‍රණාමය හා ජනාදරයට පාත්‍රවූ ශුද්ධවූ අන්තෝනි මුනිතුමා හොඳම නිදසුනකි. නැතිවී ගිය දේවල්ආ පසු ලබා ගැනීමේ මහගු වරප්‍රසාදය හා අරුම පුදුම ප්‍රාතිහාර්යයන් සිදුකිරීමේ බලය දෙවියන් වහන්සේ එතුමන්ට දනය කළ සේක. සෑම ශුද්ධවන්තයකුටම හා ශුද්ධවන්තියකටම දෙවියන්වහන්සේ විවිධ කාර්ය භාර්යයන් පැවරූ සේක. ක්‍රිස්තු ජීවිතයට සාක්ෂි දරමින් ප්‍රාණපරිත්‍යාගි වූ පළමුවැන්නාවූ තේවාචාරි ශුද්ධවූ ස්ටීවන් තුමාගේ සිට අද දක්වා දහස් ගණනක් සාන්තුවරයන්, සාන්තුවරියන් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

සියළු සාන්තුවරයින් අතරින් ශුද්ධවන්තයින්ගේ රැජනිය වන්නේ පරිශුද්ධ මරියෝත්තමාවෝය. (ලුක් 1-28) මන්ද? ස්වාමින් වහන්සේ එතුමියගේ කුස තුළ ජනිතවීමයි. එතුමිය ශුද්ධාත්මානුභාවයෙන් බිහිකළ ඒ දරුවා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේය උන්වහන්සේගේ උපතේ සිට මරණය දක්වාම සෑම දුකක් වේදනා-වක්ම දරාගත් සාන්තුවරිය ලෙසට මරියෝත්තමාව ප්‍රසිද්ධියක් උසුලයි. තම පුතණුවන් තුන් පැයක් කුරුසයේ එල්ලී සිටියදී, බලාපොරොත්තුවේ දෑස් දෙවිපියාණන් වෙත විවර කරගෙන අවසානයේදී කුරුසිය පා මුල සිටි ඒ දේව අම්මා මොනතරම් භාග්‍යවන්තද? ආදර දුවේ, පුතේ, ඒ සෙනෙහෙබර අම්මා අපටත් ආදරය කරන්නේ ඒ ආකාර යෙන්මයි. අපගේ ජීවිත අවසානයේදී අපව භාර ගන්න එතුමිය බලාපොරොත්තුවෙන් සිටිනවා. අපට නිරන්තරයෙන්ම ''නමෝ මරියනි'' උච්චාරණයේදී ඒ බව සනාථ වේ. දැනුත් අපේ මරණ මොහොතේදීත් අපි වෙනුවෙන් යදින්නට ඒ පෙම්බර දේව අම්මාට අපි ආයාචනය කරනවා. ආදර දුවේ පුතේ, අපගේ පාසල් ජීවිතය තුළ, පාසලේදී, දහම්පාසලේදී නිවසේදී, ඒ දේව අම්මාගේ ජීවිතය ආදර්ශයට ගෙන ජීවත්වන්න උත්සාහ දරමු. එසේම වරදක් දුටු තැන එය නිවැරදි කරන්නටත්, ස්වාමින්වහන්සේව අන් අයට හඳුන්වා දෙන්නටත් නොපසුබටවන්න. එය ප්‍රසාද ස්නාපන යෙන් ලද දිවැසි සේවය අගය කිරීමකි. දේව අම්මා මෙන් ඔබගේ ජීවිතයේ බලාපොරොත්තුවේ දෑස් දෙවිපියාණන් වෙත විවර කරගන්න. එය තුළින් ස්වාමින් වහන්සේට සාක්ෂි දරණ යහපත් දරු කැලක් වී රටට සමාජයට යහපත් පුරවැසියන් වන්නට මේ උතුම් දිනයේ සියළු සාන්තුවරයින්ට යාච්ඤා කරමු.

**මයිකල් සෙබස්තියන් මාමා**
රන්පොකුණගම

# නාත්තන්ඩිය දහම් පාසලේ යොවුන් දූ පුතුන්ට පෝෂක වැඩසටහනක්

නාත්තන්ඩිය ලූර්දු දේව මාතා දහම් පාසලේ 8 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා පෝෂණ වැඩසටහනක් පසුගියදා දෙව්මැදුරේදී පැවැත්වුණි. ''යොවුන් වියට අභියෝගයක් වූ අද මාධ්‍යය'' මැයෙන් පැවති මේ දෙසුම මෙහෙයවන ලද්දේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය.

නාත්තන්ඩිය සිද්ධස්ථාන පාලක ගරු උපාලි චර්චිල් සහයක ගරු නිමන්ත ප්‍රගීත් පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු මඩුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිනි. මීට එක්වූ ළමුන් ප්‍රායෝගික අභ්‍යාසය සඳහා සහභාගිවූ අයුරු මෙහි දිස්වේ. **ශ්‍රියාංගණී ෆිලිෂියා**





කුරුණෑගල පදවියේ මිල්ලව, භාග්‍යවත් ජුසේ වාස් කනිටු දෙව්සත්හලේ ඉගෙනුම ලබන, පුහුණුව ලබන සිසුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 නොවැම්බර් 02 වන සෙනසුරාදා දින දෙව්සත්හලේ දී පැවැත්වේ.

දෙව්සත්හලේ අදියුරු ගරු නිහාල් ඔබ්‍රිස් පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කරනු ලබයි. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය.

## උදයක අසිරිය

සමන්ගිරි සිපගත් හිරු දෙව් රද වන අරණේ අහුමුලු සොයා කෙරෙන දවසේ පළමු චාරිකාවට සැරසෙන ඒ මොහොත දෙස බලා සිටින සියොතුන් කැළ මිහිරි ගීත ගයමින් මන බන්දනීය දවසකට ආසිරි ගී ගයයි. මිහිදුම් සළු කුමරියෝ නිදි ගැට කඩමින් අවදි වෙති. මල් කුමරියෝ හිරු රැස් පතිත වන තුරු දෙනෙත් අයා බලා සිටිති. දෙමාපියෝ ළමුන් පෙරටු කොට ගෙන හිමිදිරියේම අවදි වෙති. සුදුම සුදු කොක් රැනක් සේ ළමෝ සිප්හල වෙත පියමන් කරති.

**නිමාෂි සංජුලා**
06 ශ්‍රේණිය
ලොයලා විදුහල - බෝපිටිය



## ජපමාල මව්නි

සුරලොවේ මනුලොවේ රජිනිය
දහස් ජනතා ආදර මව් තුමිය
පාපයෙ නපුරෙන් ඔබ දරු කැල සැම
ගලවා රැක ගත මැන අම්මේ

**නිලාන් හිරුජිත්**
09 ශ්‍රේණිය
පන්නිපිටිය ධර්මපාල විදුහල

## ජේසු අම්මේ

ජේසු අම්මේ මේ අහන්න
අපේ වැරදි කියා දෙන්න
අපිව හරි මග යවන්න
පුංචි අපට කියා දෙන්න

ජේසු අම්මේ මේ අහන්න
අපට සතුට නිතර දෙන්න
ඔබත් සමග බෙදා ගන්න
අපේ ළඟම නිතර ඉන්න

**විනුකි හසිත්මා ද සිල්වා**
04 ශ්‍රේණිය
යහපත් එඬේරා කන්‍යාරාමය
කොටහේන.



## දවසක ඇරඹුම

මග දිග මත එක් එළියකි
දිස් වෙන්නේ
හිමින් සැරේ සැම හදවත්
පුබු දන්නේ
කඳු අතරම තුරු අතරම
දිළි සෙන්නේ
හිරු එළියයි ගුවන් තලේ
වැජ ඹෙන්නේ

රුක් ගොමුවෙන් පරිසරයම පුබුදන්නේ
සිව්පාවුන් එහේ මෙහේ අත විසිරෙන්නේ
පියකරු සිතුවිලි හද ගැබ තුළ තෙරපෙන්නේ
සොඳුරු සොබා උදයකි අද දිස් වෙන්නේ

**අමේෂි ගීතිකා**
09 ශ්‍රේණිය
සදාසරණ
මාතා දහම්
පාසල
බලගල




## මගේ නංගි

මගේ නංගීගේ නම විශ්මි ආකර්ෂා
මගේ නංගී හරි හොඳයි
හැබැයි පුංචි දඟකාර කමකුත් තියෙනවා
මගේ නංගි හිනා වෙනකොට ලස්සනයි
ඇය සෙල්ලම් කරන්න ආසයි
මම නංගීට ගොඩාක් ආදරෙයි

**ශානියා රොෂානි**
04 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ



## දේව මැවිල්ල

ගස්වල මල් පිපී දිලෙනා
ගංගා නදී ගලා බසින
කඳු මැද්දෙන් ඉර පායන
මෙලොව අපෙයි සිත් පිනවන

**ඇන් නෙත්තරු**
05 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් බාලිකා
ප්‍රාථමික විදුහල
කඳාන



# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ක්‍රිස්තියානි යාච්ඤාව

**34. ශුද්ධවූ පාවුළු තුමා රෝමවරුන්ට ලියූ ලිපියට අනුව වචනවලින් කිව නොහැකි සුසුම්ලෑම්වලදී දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් අයදින්නේ කවුරුන්ද?** ⋆ ශුද්ධාත්මයාණෝ ය.

**35. ශුද්ධවූ පාවුළු තුමා යාච්ඤාව හඳුන්වා දී ඇත්තේ.....**

⋆ ශුද්ධාත්ම දීමනාවක් වශයෙනි.

### යාච්ඤාව සහ ශුද්ධවන්ත ජීවිතය

**36. අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමාගේ යැදුමක් වුයේ.**

⋆ ''ස්වාමිනි, මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව'' යන්නය.

**37. "ස්වාමිනි , මා ඔබගේ සාමයේ අවියක් කළ මැනව" මෙසේ යාච්ඤා කළේ.** ⋆ අසීසියේ ශුද්ධවූ ෆ්‍රැන්සිස් මුනිතුමාය

**38. "යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජිවත් වීමට නොදනී" මෙසේ පවසන ලද්දේ** ⋆ ශුද්ධවූ ජෝන් ක්‍රිසොස්තම් තුමා ය.

### යාච්ඤාව වර්තමාන සමාජයට

**39. නිරන්තර යාච්ඤාවේ වැදගත් කම පෙන්වා දුන් ක්‍රිස්තු ඉගැන්වීම අනුව යාච්ඤාව ඔබගේ දෛනික ජීවිත අංගයක් කර ගන්නා අයුරු කරුණු පහකින් පෙන්වා දෙන්න.**

⋆ යාච්ඤාවේ ස්ථිරත්වයේ සිටීම

⋆ යාච්ඤාව තුළින් මනස සන්සුන්ව තබා ගැනීමට හැකිවීම

⋆ පාපයෙන් ඈත් වී යන පැවැත්මක් ඇති කර ගැනීම

⋆ ජීවිත අභියෝග ජය ගැනීම සඳහා යාච්ඤාව තුළින් දේව වරප්‍රසාද ලබා ගැනීම

⋆ දේව දරුවන් මෙන් දේව ගුණාංග ජීවිතයට ඈඳ ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වීම.

**40. ඔබගේ විභාගයේ ප්‍රතිඵල ලැබුණු පසු ඔබ දෙවි පියාණන්ට කරන ස්තුති කිරීමේ යාච්ඤාවක් වචන 50 කින් පමණ ලියන්න.**

⋆ ආමන්ත්‍රණය දෙවි පියාණන් වහන්සේට

⋆ දෙමාපියන්ගෙන් ලැබුණු සහයෝගයට ස්තුතිය සහ ඔවුන්ට ආශිර්වාද කිරීමට

⋆ පැවිදි පිරිසගෙන් හා ගුරු භවතුන්ගෙන් ලැබුණු අනුග්‍රහය

⋆ යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ලබා දීම

⋆ යහළුවන්ගෙන් හා හිතවතුන්ගෙන් ලැබුණු සහයෝගයනට ඔවුන් වද ආශිර්වාද කිරීම.

⋆ ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාවේ ලක්ෂණ 05 ට එකගව ලිවිය යුතුය.

### භාවනාව

**41. භාවනා කිරීමේදී අත්‍යවශ්‍ය සාධකය කුමක්ද?**

⋆ සිත එකලස් කර ගැනීම

**42. භාවනාවේ පළමු පියවර සහ දෙවන පියවර ලියා දක්වන්න.**

⋆ පළමු පියවර:- ''ඔබ ඉන්න විදිහට ඉන්න, මම ඔබට බොහෝ ආදරෙයි''

⋆ දෙවන පියවර :- ''ඔබේ ජීවිතයේ ඇත්ත ජේසු සමිඳුන්ට දෙන්න''

**43. "ඔබේ ජීවිතයේ අයිතිය ජේසු සමිඳුන්ට දෙන්න" භාවනාත්මක ජීවිතයේ තුන්වන පියවර වන ඉහත උපුටනයෙන් පැහැදිලි වන්නේ.** ⋆ ජේසු සමිඳුන්ට සිය කැමැත්තෙන්ම අයිති බවය.

**44. අපගේ ජීවිතයේ අයිතිය දෙවිඳුන්ට බාර දෙන විට අපි උන්වහන්සේට** ⋆ යටත් වන්නෙමු.

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

## ලූර්දු පුද පියස



ගඩොලින් ගඩොල ගොඩ නගමින්
අද දවසේ දිස්වෙයි සැම නෙත් අභිමුව
ඇති සුන්දරත්වය ලූර්දු පුද පියසේ
දොස් පරොස් නින්ද පැසසුම් මැද්දේ
පෙර මං තනයි නිතැතින් නොසැ ලී කිසිසේ
වත පුරා ගලා හැලෙනා
සිනා රැල්ලේ සඟවා ගෙන ඇත
නො පවසා දුක් හදවත මැද්දේ
පාලක පියේ මේ සියල්ල තුළ ඇත්තේ
දෙවිඳුන් ඔබ හට දුන් ආසිරි වරම් රුසේ

**තිළිණි තාරිකා (ආචාර්ය මඩුල්ල)**
ලූර්දු දේව මාතා දහම් පාසල
නාත්තන්ඩිය

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 29

## මැරෙන තුරු ජීවිත රහස හෙළි නොකළ ලෝක මහ ක්‍රිස්තියානි සංගීතඥයා

පසුගිය ලිපිය හා සබැඳේ

### මවගේ වියෝව

ක්ෂය රෝගයෙන් පෙලුන බිතෝවන් ගේ මව මරණාසන්න බවට පත් වී සිටී බව ආරංචි වීමෙන් හෘදය වේදනාවෙන් පිරි තරුණයා ගෙදර යන්නට මොසාට් ගෙන් සමු ගන්නට ගිය අවස්ථාවේදී, මෙම මහා ගුරුවරයා තම මහා ගෝලයාට කීවේ මෙයය. ''ලුඩ්විග් , සංගීතය ඉගෙන ගන්ට මීට පසු ඔබ කිසිවකු ලඟට නොයන්න. ඔබට තවත් උගන්වන්නට හැකියාවක් ඇති සංගීත දක්ෂයෙක් ලොවේ ඇත කියා මම නොසිතමි. ඔබ මගෙන් ඉගෙන ගත් පමණ ම මමද ඔබෙන් ඉගෙන ගතිමි. ආදර දරුව, එක් දෙයක් මම ඔබෙන් ඉල්ලමි. එනම් දෙවීකත්වය සමාජය කිට්ටුකරන සංගීතය පමණක් ලොවට දෙන්න. කිසි දිනක පහත් රසයෙන් නො ලියන්න. නොගයන්න. නොවයන්න. පහත් රසයෙන් ගයන්නෝ, වයන්නෝ ලොවේ එමට ඇත. එයට ඔබ හිමි නැත. ඔබට ලැබී තිබෙන විශේෂ සංගීත තලෙන්තු, දේව මහිමයත් සමාජ සංස්කෘතියත් උදෙසා වියදම් කරන්න. ඔබට දෙවියන් වහන්සේ ආශිර්වාද කරන සේක්වා.

පියෙකු ලෙස ඔහුට ප්‍රේම කළ, සතයක්වත් නොගෙන සංගීත කලාව නොමැන නොගැන නොකිරා ඔහුට දානය කළ මෙම උත්තමයා ඉදිරියේ දණින් වැටී ආයුබෝවන් කියා තම මව් බිම බලා, මරණාසන්න මව වෙතට හනික හනික ගියේය. පණ අදින මෑණියන් සමග කථා කිරීමට ඔහුට පැය භාගයකට වඩා ලැබුණේ නැත. ඔහු ගෙදරට සම්ප්‍රාප්ත වූ වේලෙහි ඔහු පියා වෙරි වෙන්ට බී නිදිය. අතපය ශීතල වී අඩපණ වී සිටි අසරණ ජොහානා ඈ පුතුන් දුටු විට ම අමන්දානන්දයෙන් ඉපිලී, ඈ යහන මත ඈට කිට්ටුවෙන් පුතුන් වාඩි කරවා මෙසේ කීවාය. ''මා ආදර පුතා ලුඩ්විග්, ඔබ බේබදු පියා ගිය මග ඔබ නොයන්න. ඔබ යම් දිනක විවාහ වුවොත් ඔබේ ස්ත්‍රියට ප්‍රේම කරන්න. ඔබ පියාගෙන් මට සිදු වූ දෙය ඔබෙන් ඔබේ ස්ත්‍රියට කිසි කලෙක සිදු නොවේවා. මගේ මරණයෙන් පසු ඔහු මා ගැන සිතන්නේවත් නැත. ඔහුගේ දෙවියා මත් පැන් බෝතලය ය. ඔහු ඔබ ගැනත් ඔබේ බාල සොයුරන් දෙදෙනා ගැනත් කරදර නොවන බව මම දනිමි. මේ වන තුරු දුක් වේදනාවෙන් පිරි ජීවිතයක් මා ගත කළේ ඔබේ දියුණුව පතා ය. සංගීත ලෝකයෙන් ලොව ආලෝක කරන පුතකු බිහි කිරීමේ වාසනාව මා ලත් බැවින් මම ආඩම්බර මවක් වෙමි. පුතා දැන් ඔබ මා අන්තිම වරට සිප ගන්න. මා විවාහ වූ දින හා ආදර මෑණියෝ මා කර පැළඳු රත්රන් දම්වැල අද සිට ඔබ ගෙලේ වේවා. ලුඩ්විග්, දැන් ඔබ පියානෝව ට ගොස් මිහිරි තාලයක් වයා මනරම් ගීයක් ගයන්න. ඔබේ ගැයුම් හා වැයුම් අසමින් දෙවියන් ගැන සිතමින් මරණයට පැමිණීම මගේ ප්‍රීතිය හා සැනසීම වේවා''.

බිතෝවන්ගේ මුළු ජීවිත කාලයේදී ඔහු හැඬු අවස්ථා ඉතා ටික විය. ඉන් එකක් මෙය විය. ඔහු තම ආදර අම්මා බදාගෙන හැඬුවේය. ඇගෙන් අකැමැත්තෙන් ඉවත් විය.



ලුඩ්විග් වැන් බිතෝවන්

පියානෝවට ගොස් වාඩි වී ''අනේ මම කුමක් වයම් ද කුමක් ගයම් ද''කියා තමාට ම කියා ගත්තේ ය. තම ගුරු වූ මොසාට් ගේ අනු දැනුමැතිකම ඇතිව ''අම්මාගේ ප්‍රේමය'' යන හිසින් ඔහු ප්‍රස්ථාර ගත කළ ගීයක් මෙහිදී මතක් විය. සංගීත දෙව් දුව ඔහුට ආවේශ වුණි. පණ අදින අම්මා අමතක විය. බිතෝවන් වැයුවේය. ගැයුවේය. වයමින් ගැයුවේය. ගයමින් වැයුවේය. ඔහු ගැයූ ගීතයේ අදහස මෙය විය. ''ජීවිත ගමනේ හැම සටනින් ම මා පැරදුනත් , නෑදෑ හිතවත් අය මා අතහැර දැමුවත්, සාක්කුවේ එක සතයක්වත් නොතිබුණත්, මා ගෙදර එනතුරු නොකානොබී සිත කරදරයෙන් මග බල බලා සිටින්නේ මා ආදර අම්මාය. මව්නි, ආදර මව්නි ඔබ මා හද රජ කරන එකම රැජිනිය වේවා'' බිතෝවන්ගේ මුළු ජීවිත කාලයේදී ඔහු ගැයූ වැයූ ගී අතරින් එපමණ ජීවමාන අන්දමට ගැයූ වැයූ ගීයක් තවත් නැත කියා, ඔහු පසුව කියා තිබේ.

වෙරි මතින් නිදා සිටි පියා මධුර මනෝහර ගීයේ ශබ්දයට නැගිට්ටේය. ඔහුට නො දන්වා වියෙනා නුවරට ගිය පුතුන් දැක්කේය. ඉතා අලංකාරයට ගැයූ වැයූ බැවින් පුතුට උරණ වීමට පියාට අමතක විය. පිය පුත් දෙදෙනා ජොහානාගේ ඇඳ ලඟට යන විට, ඈ පරලොව ගොස්ය. ඇගේ භූමදානයට පසු දින බිතෝවන් ගේ අදැහැමි පියා ජොහානාට අයිති ඇඳුම් පැළඳුම් සියල්ල විකුණා වෙරි වෙන්ට කුණු වෙන්ට ලෙඩ වෙන්ට බීවේය. පියාගේ නොමනා ජීවිතය නිසා දසසත් වියෙහි වූ බිතෝවන්ට තම කුඩා සොහොයුරන් දෙදෙනා ආරක්ෂා කිරීමට සිදු විය. කොලෝන් නුවර ධනවතුන්ගේ ගෘහයන් හි ප්‍රිය සම්භාෂණ පැවැත්වූ දිනයන්හි, අමුත්තන් විනෝද කිරීමට බිතෝවන් කැඳෙව්වේය. එම නුවර දේව මැදුරේ දේව මෙහෙයට ඔහු වාදනය කරමින් ද ධනවතුන්ගේ කුඩා දරුවන්ට සංගීතය උගන්වමින්ද ලැබූ මුදල් තම සොහොයුරන් දෙදෙනා ගේ අධ්‍යාපනයට හා කෑම බීම ට වියදම් කළේය. දවස මුළුල්ලේ තැබෑරුම් ලඟ රස්තියාදු වී නොමිලයේ බී, රෑගෙදර එන පියාට ආහාර සැපයීම ද බිතෝවන්ගේ වගකීම විය.

සංස්කාරක පියතුමන් විසිනි

ඉදිරියට .......

කිතුනු උරුමය

# රට රටවල කතෝ

| රට | කතෝලික පිරිස | මුළු ජනගහණය | ප්‍රතිශතය | රදගුරු පදවි | පදවි පූජක |
|---|---|---|---|---|---|
| ඩෙන්මාර්කය | 35,000 | 5,501,000 | 0.64% | 1 | 39 |
| ගැබියාව | 35,000 | 1,680,000 | 2.08% | 1 | 15 |
| ජෝර්දනය | 31,000 | 6,181,000 | 0.5% | 1 | 23 |
| මොනාකෝ | 29,000 | 32,000 | 90.63% | 1 | 13 |
| තුර්කිය | 28,000 | 73,639,000 | 0.03% | 6 | 11 |
| ලික්ටන්ස්ටයින් | 25,000 | 33,000 | 75.76% | 1 | 19 |
| ඉරානය | 24,000 | 74,798,000 | 0.03% | 5 | 6 |
| මොරොක්කෝව | 23,000 | 31,700,000 | 0.07% | 2 | 6 |
| බෲනායි | 21,000 | 347,000 | 6.05% | 1 | 3 |
| ජිල්බ්‍රාල්ටා | 21,000 | 28,000 | 75.00% | 1 | 9 |
| කාම්බෝජය | 21,000 | 12,571,000 | 0.17% | 3 | 6 |
| මෝල්දෝවා | 20,000 | 4,247,000 | 0.47% | 1 | 6 |
| ටියුනීසියා | 20,000 | 9,700,000 | 0.21% | 1 | 13 |
| වනයිජර් | 16,000 | 11,880,000 | 0.13% | 2 | 14 |
| මැසිඩෝනියා | 14,000 | 2,350,000 | 0.60% | 2 | 12 |
| වසයිප්‍රස් | 10,000 | 780,000 | 1.28% | 1 | 5 |
| ෆිනලන්තය | 8,000 | 5,206,000 | 0.15% | 1 | 6 |
| ජිබෞටි | 7,000 | 557,000 | 1.26% | 1 | 2 |
| නේපාලය | 7,000 | 24,421,000 | 0.03% | 1 | 9 |
| සා පියරේ හා මිබලින් | 6,000 | 6,000 | 100.00% | 1 | - |
| ඇස්ටෝනියාව | 5,000 | 1,370,000 | 0.36% | 1 | 9 |
| අයිස්ලන්තය | 5,000 | 290,000 | 1.72% | 1 | 6 |
| කොමොරෝස් | 4,000 | 907,000 | 0.44% | 1 | 1 |
| මෞරිටානියා | 4,000 | 2,600,000 | 0.15% | 1 | 3 |
| ඇල්ජීරියාව | 3,000 | 31,135,000 | 0.01% | 4 | 36 |

# ලික ජනගහණය

ශිරාන් මෛත්‍රී විසිනි

| නිකායික පූජක | මුළු පූජකවරු | ස්ථිර තේවාචාරීන් | පැවිදි (පිරිමි) | පැවිදි (කාන්තා) | මිසම් |
|---|---|---|---|---|---|
| 38 | 77 | 5 | 43 | 222 | 50 |
| 10 | 25 | - | 21 | 42 | 54 |
| 5 | 28 | - | 5 | 15 | 28 |
| 5 | 18 | 1 | 5 | 15 | 6 |
| 50 | 61 | 2 | 68 | 115 | 43 |
| 10 | 29 | - | 10 | 57 | 10 |
| 11 | 17 | 3 | 11 | 30 | 17 |
| 40 | 46 | - | 56 | 239 | 40 |
| 1 | 4 | - | 1 | 2 | 3 |
| 1 | 10 | - | 4 | 9 | 6 |
| 36 | 42 | - | 47 | 72 | 36 |
| 8 | 14 | 1 | 18 | 40 | 11 |
| 21 | 34 | - | 25 | 139 | 11 |
| 30 | 44 | - | 35 | 81 | 17 |
| 3 | 15 | - | 3 | 32 | 7 |
| 2 | 7 | - | 5 | 3 | 9 |
| 10 | 16 | 1 | 12 | 36 | 7 |
| 5 | 7 | - | 9 | 19 | 6 |
| 40 | 49 | - | 56 | 115 | 42 |
| 2 | 2 | - | 2 | 6 | 2 |
| 5 | 14 | - | 5 | 21 | 6 |
| 5 | 11 | - | 5 | 34 | 4 |
| 3 | 4 | - | 4 | 4 | 2 |
| 10 | 13 | - | 10 | 34 | 6 |
| 56 | 92 | 1 | 77 | 195 | 37 |

නිමි.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

**ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.**

**පාඩම් අංක : 114**

**අපි 'to', 'for' සහ 'so that' පිළිබඳව කතා කළා. අපි තව දුරටත් 'for' ගැනත් 'to' සහ 'for' වැකිවල යෙදෙන හැටි ගැනත් බලමු.**

I get lonely if there's nobody **<u>to talk</u>** to.
(අයි ගෙට් ලෝන්ලි ඉෆ් දෙයාර්ස් නෝ බොඩි ටු ටෝක් ටු)
කතා කිරීමට කෙනෙක් නැත්නම් මට තනිකම දැනේවි.

I want something **<u>to open</u>** this bottle with.
(අයි වෝන්ට් සම්තිං ටු ඕපන් දිස් බොටල් විත්)
මට මේ බෝතලේ ඇරීම සඳහා යමක් ඕන.

They gave us some money **<u>to buy</u>** some food.
(දේ ගේව් අස් සම් මනි ටු බයි සම් ෆුඩ්)
අපිට ආහාර මිළදී ගැනීමට ඔවුන් මුදල් ටිකක් දුන්නා.

You have much opportunity **<u>to learn</u>** English.
(යූ හැව් මච් ඔපර්චුනිටි ටු ලර්න් ඉන්ග්ලිෂ්)
ඉංග්‍රීසි ඉගෙනීමට ඔබට හොඳට අවස්ථාව තියෙනවා.

I need a few days **<u>to think</u>** about your proposal.
(අයි නීඩ් අ ෆිව් ඩේස් ටු තින්ක් එබවුට් යුවර් ප්‍රොපෝසල්)
ඔබේ යෝජනාව ගැන සිතා බැලීමට මට දින කීපයක් ඕනා.

යමක් කිරීමට අවශ්‍යතාවය හැඟවීමේදී ක්‍රියා පදයට "ට" යන්න එකතු කිරීමෙන් සාමාන්‍යයෙන් අපට අවශ්‍යය අදහස ලැබෙනවා.
මට යන්න ඕන = මට යාම<u>ට</u> අවශ්‍යයි
මේක දෙන්න ඕන = මට මේක දීම<u>ට</u> අවශ්‍යයි
දැන් නාන්න ඕන = නෑම<u>ට</u> අවශ්‍යයි.

මෙතන මෙහෙම සිංහලෙන් "<u>ට</u>" යන්න යෙදූ අවශ්‍යතාවය අඟවන වචනයක් ලෙස තමයි 'to' බොහෝ විට ඉංග්‍රීසියේදී භාවිතා වෙන්නෙ. බොහෝ විට මෙම 'to' යෙදෙන හැටි පුහුණුවිය හැක්කේ භාවිතයෙන්ම පමණයි.

**තව නිදසුන් කීපයක් බලමු.**

I want **<u>to go</u>** to church. (අයි වෝන්ට් ටු ගෝ ටු චර්ච්)
මට පල්ලියට යාමට අවශ්‍යයි)

It's not good **<u>to eat</u>** a lot of sweets.
(ඉට්ස් නොට් ගුඩ් ටු ඉට් අ ලොට් ඔෆ් ස්වීට්ස්)
ගොඩක් පැණි රස කන්න හොඳ නෑ (කන ක්‍රියාව කිරීමට)

සාමාන්‍යයෙන් **'to'** යන නිපාත පදය වැකියේදී යෙදෙන්නේ ක්‍රියා පදයකට ඉදිරියෙන්. නිදසුන් කීපයක් අපි ඉහත දැක්කා. තව නිදසුන් කීපයක් මතක් කරගනිමු.

I am going **<u>to bathe.</u>** (to + verb) (අයැම් ගොයිං ටු බේද්)
මම නාන්න යනවා.

They go **<u>to play</u>** football every day. (to + verb)
(දේ ගෝ ටු ප්ලේ ෆුට්බෝල් එව්රි ඩේ)
ඒ ගොල්ලො හැමදාම ෆුට්බෝල් ගහන්න යනවා.

I am going **<u>to learn</u>** Tamil. (to + verb)
(අයැම් ගොයිං ටු ලර්න් ටැමිල්) මම දෙමළ ඉගෙන ගන්න යනවා.

I want **<u>to give</u>** him a present. (to + verb)
(අයි වෝන්ට් ටු ගිව් හිම් අ ප්‍රසන්ට්) මට ඕන ඔහුට තෑග්ගක් දෙන්න.

Sheela wants **<u>to see</u>** a doctor. (to + verb)
(ශීලා වෝන්ට්සු ටු සී අ ඩොක්ටර්)
ශීලාට වෛද්‍යවරයකු මුණ ගැහෙන්න ඕන.

**බලන්න ඉහත හැම වැකියකම .එද. සමග යොදල තියෙන්නෙ ක්‍රියා පදයක්. :එද. ඩැරඉ˚ ඒ වගේම .එද. සමග නාම පදයක් යෙදෙන්නත් පුළුවන්**

Vishaka is going **<u>to the library.</u>** (to+noun)
(විශාකා ඉස් ගොයිං ටු ද ලයිබ්‍රරි) විශාකා පුස්තකාලයට යමින් සිටියි)

He is kind **<u>to me.</u>** (හී ඉස් කයින්ඩ් ටු මී)
ඔහු මට කරුණාවන්තයි. (මා හට)

I am going **<u>to the river.</u>** (අයැම් ගොයිං ටු ද රිවර්)
මම ගඟට යනවා.

They go **<u>to church</u>** every Sunday. (to + noun)
(දේ ගෝ ටු චර්ච් එව්රි සන්ඩේ) ඒ ගොල්ලො හැම ඉරිදාම පල්ලි යනවා.

Nevil is going **<u>to Jaffna.</u>** (to + noun)
(නෙවිල් ඉස් ගොයිං ටු ජැෆ්නා)
නෙවිල් යාපනයට යනවා.

My brother went **<u>to the post office.</u>** (to + noun)
(මයි බ්‍රදර් වෙන්ට් ටු ද පෝස්ට් ඔෆිස්)
මගේ සොහොයුරා තැපැල් කන්තෝරුවට ගියා.

බලන්න. ඉහත වැකි සේරම තුළ **to** සමග යොදල තියෙන්නෙ නාම පදයක් බව ඔබට පේනව ඇති. **(to + noun)**






මාරවිල මීසමට අයත් ළමෝ 95 ක් පසුගියදා ශු. කානික්ක දේව මාතා වහන්සේගේ දේවස්ථානයේදී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙය මීසම් සේවක ගරු අයිවන් පීටර් සහයක ගරු දිනේෂ් සෝවිස් පියතුමා, ගරු සාර්ටෝ නෝනිස් පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මීසම් සේවක , සහයක පියතුමන්ලා ළමුන් පුහුණු කළ ගුරු භවතුන් සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශ්‍යාමා සුදන්ති පෙරේරා**

පුත්තලම ශාන්ත මරියා දේවස්ථානයට අයත් දරු දැරියන් 42 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. මීසම් සේවක ගරු වින්සන් ජෙයරාසා, මීසම් සහයක ගරු ශෙහාන් ෆර්ඩිනැන්ඩස් යන පියතුමන්ලා හා දරුවන් පුරුදු පුහුණු කළ ගරු රොස්ලිස් ප්‍රනාන්දු (ශු.ප.නි.) පැවිදි සොයුරිය හා ගුරුමාතාව සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.



✍ **ශ්‍රියානි ෆර්ඩිනැන්ඩස්**



කටුනේරිය මීසමේ දරු දැරියෝ 150 ක් පසුගියදා කටුනේරිය සාන්ත සෙබස්තියන් දෙව් මැදුරේ දී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

දේව මෙහෙය මීසම් සේවක ගරු සුනිල් විජේසිංහ, මීසම් සහයක ගරු නුවන් එමල්ක පීරිස් පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු මඩුල්ල එක්ව මෙදින කටයුතු සංවිධානය කෙරිණි. ළමුන් ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරන අයුරු මෙහි දිස්වේ.

**සේයා - ටෙරන්ස් තිසේරා / සටහන - සජානි ප්‍රනාන්දු**

**කටුගස්තොට ශ්‍රී හෘදයේ දහම් පාසල් ළමෝ 12 ක් පසුගියදා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.**

**දේව මෙහෙය ගරු ශමින්ද ජයවර්ධන සා.බෙ.නි. පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ආරාධිත පියතුමා මීසම් සේවක ගරු මයිකල් සන්දනම් පියතුමා , ගරු පැවිදි සොයුරිය සිංහල හා ඉංග්‍රීසි අංශය භාර ගුරුවරියන් දරුදැරියන් සමග සේයාරුවකට පෙනී සිටි අයුරු.**

**ශාන්ති ජම්බුගේ**





**වෙළෙඳ සැලක්**

**ක්‍රිස් මෙහාන් පෙරේරා**

09 ශ්‍රේණිය
සා. සෙබස්තියන් දහම් පාසල
කටුනේරිය



**යහපත් බැටළු එඬේරාණෝ**

**අමේෂා පෙරේරා**

11 ශ්‍රේණිය
ශා. මරියා දහම් පාසල
කෑගල්ල



**මව් පිය සෙනෙහස**

**ෂෙහිනි මරීෂා**

07 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහා විදුහල



**නියඟය**

**සහන් චමෝද්**

09 ශ්‍රේණිය
දොන් බොස්කෝ දෙව්සත්හල
කටුකෙන්ද



**ශු. අසීසි ප්‍රැන්සිස් මුනිතුමා**

**උමේෂ් නිමන්ත**

09 ශ්‍රේණිය
සාන්ත බෙනඩික් දහම් පාසල
කන්ජුක්කුලිය



**ජේසුගේ කුඩා මල තෙරේසා තුමිය**

**රුසිත් ලක්ෂාන් නවරත්න**

09 ශ්‍රේණිය
ලූර්දු දේව මාතා දහම් පාසල
පොල්ගහවෙල

# සාන්ත ලිබේරියස් පාප්තුමා



## සුදුවර චරිත

**වර්ෂ 352 මැයි මස 17 වන දින පේදුරුතුමාගේ ආසනයේ 36 වන හිමිකරුවා ලෙස රෝම පූජකවරු ලිබේරියස් තුමන් තෝරා පත්කරගත්හ. ඒතුමාගේ පාලක සමය වර්ෂ 14 ක් පුරා පැවතිණි. එතුමා ජීවමාන සාන්තුවරයකු බඳු විය. එතුමාගේ ඒකායන පැතුම වූයේ ප්‍රාණ පරිත්‍යාගි වරයෙකු වීමය. එතුමාගේ මෙම වර්ෂ 14 ක පාලන සමය තුළ ඒරියන් මිථ්‍යා මතවාදයෙන් සාන්ත සභාව හා එහි විශ්වාසය, රදගුරුවරුන්, පුජකවරුන් හා සැදැහැවතුන් ආරක්ෂා කර ගැනීම සඳහා එතුමා වෙහෙසිනි.**



අවාසනාවකට මෙන් බලයේ සිටි කොන්ස්ටන්ෂියස් අධිරාජයා ඒරියන් වාදය කෙරෙහි ඇල්මක් දැක්වීය. ඔහු ඒ වනවිටත් ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු අතනේසියස් තුමන් නෙරපා දමා තිබුනි. වර්ෂ 353 දී රෝමයේ දී පවත්වන ලද මන්ත්‍රණ සභාවට එරෙහිව යමින් ඉතාලියට පිටතින් පිහිටි රදගුරු පදවිවලට ඒරියන් රදගුරු වරුන් පිරිසක් ද පිටුවහල් කරන ලදහ. ලිබේරියස් පාප්තුමා ඔවුන් වෙත ලිපියක් යවමි-න් ඔවුහු සැබෑ ප්‍රාණ පරිත්‍යාගින් බව පැවසු අතර එතුමා ඔවුන්ගේ එක් කෙනෙකු නොවීම ගැන කනගාටුවට පත්විය.

අල්ලසක් දී පාප්තුමාගේ සිත දිනාගන්නා අදහසින් අධිරාජයා රත්රන් වගයක් දී ලිබේරියස් තුමන් මුණ ගැසීම සඳහා රෝමය වෙත නපුංසකයකු යැවීය. නමුත් එතුමා එම ත්‍යාගය ප්‍රතික්ෂේප කළ අතර පිටුවහල් කර සිටින සියළුම රදගුරුවරුන්වත් නැවත කැඳවා ඔවුන්ගේ පදවිවලට පත් කළ යුතු යැයි අධිරාජයාට බලකර සිටියේය. කොන්ස්ටන්ෂියස් වියරු වී පාප්තුමන් හා රෝම සභාවේ ප්‍රමුඛයන් සියළු දෙනාම අත්අඩංගුවට ගන්නාලෙස අණ කළේය. මෙම නියෝගය ඉදිරියේ රෝම සභාවේ බොහෝ ප්‍රමුඛයෝ සැඟවුණහ. පාප්තුමා පමණක් අධිරාජයාගේ කෝපාවිෂ්ටභාවය ඉදිරියේ නොසැලී සිටියේය.

ලිබේරියස් තුමන් මිලාන් වෙත ගෙන යනු ලැබිණි. එහිදී එතුමනට අධිරාජයා මුණ ගැසිණි. ''මගේ නියෝගයන්ට එරෙහිව ලෝකයේ බලාපරාක්‍රමයට විරුද්ධව සිටීමට ඔබ කවුරුන්දැයි'' අධිරාජයා ඇසීය. ''ඔබ හොඳින් දන්නා පරිදි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සභාවේ කටයුතු මෙහෙයවීම පිණිස දෙවියන් වහන්සේගේ කැමැත්ත මත පත් කර ඇති සේවකයා වන ලිබේරියස් මම වෙමි'' යි නිර්භීතව පාප්තුමා පිළිතුරු දුන්නේය. එලෙසම ''ඒරියන් වරුන් ප්‍රතික්ෂේප කොට නිසියානු විශ්වාස ප්‍රකාශනයට අත්සන් තබා, පිටුවහල් කර සිටින සියළුම රදගුරුන්වන් නැවත කැඳවන ලෙස මම ඔබගෙන් තරයේ ඉල්ලා සිටිමි'' යි එතුමා තවදුරටත් පැවසීය. පිටුවහල් කර සිටින රදගුරුවරුන් ප්‍රතික්ෂේප කිරීම අනුමත කොට එයට අත්සන් කිරීමට එකඟ වන්නේනම් ඔබ රෝමයට යැවීමට මම කැමැත්තෙමි''යි අධිරාජයා පිළිතුරු දුන්නේය.

''මා දැනටමත් රෝමයට හා මාගේ සංඝයට සුබ පතා පැමිණ ඇති අතර සාන්ත සභාවේ නීති හා බලන කල රෝමය මාගේ නිවහන මට එතරම් වැදගත් කමක් නැතැ''යි පාප්තුමා පැවසීය. මෙම නිර්භිත වදන් නිසා ලිබේරියස් තුමා පිටුවහල් කරනු ලැබීය. ඒරියන් රදගුරු වරයකු වූ ෆිලික්ස් නැමැත්තා පාප්තුමන් ලෙස අධිරාජයාවිසින් රෝමයට යවනු ලැබිණි. ඔහු වනාහි තෙවන ව්‍යාජ පාප්තුමාය. පූජකවරු හා සැදැහැවතුන් ෆිලික්ස් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අතර ඔහු තම ජීවිතය පිළිබඳව භීතියෙන් යුතුව කල් ගෙවීය. ක්‍රිස්තියානිහු දිවා රෑ දෙකෙහිම ලැටරන්හි සාන්ත ජුවාම් දෙව්මැදුර වෙත රැස්වී පිටුවහල් කර සිටි ලිබේරියස් පාප්තුමන් උදෙසා යාච්ඤා කළහ. කොන්ස්ටන්ෂියස් රෝමයට පැමිණ ෆිලික්ස් කිසිවක් කර නැති බව හා ජනයා ලිබේරියස් පාප්තුමා නැවත පත් කිරීම තරයේ ඉල්ලා සිටින බව දුටුවේය. වර්ෂ 358 දී එතුමා නැවත කැඳවන ලදි. එයින් වර්ෂ 8 කට පසුව එතුමා මරණයට පත්විය.

**අසේල දසනායක විසිනි**

## ප්‍රහේළිකා අංක 41

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | ■ |
| | ■ | | ■ | 4 | 5 |
| | ■ | 6 | 7 | | |
| 8 | 9 | ■ | | ■ | |
| ■ | | ■ | ■ | 10 | ■ |
| ■ | 11 | | | | ■ |

### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදෙශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදෝම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රිය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

# ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ ලෝක ළමා දින සැමරුම්



තුම්මෝදර මීසමේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ ධර්මදූත ළමා සමාජය එක්ව ලෝක ළමා දිනය සැමරීය. ළමුන් මීසම් සේවක ගරු ප්‍රැන්සිස් පුල්ලේ පියතුමා, සජීවකයින් සමග ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **රේණුකා ප්‍රියන්ති.**

මට්ටක්කුළිය ශ්‍රී කල්‍යාණී ගංගාරාම මාවතේ ''කැකුළු ළමා සමාජය'' මගින් ලෝක ළමා දිනය සමරා මට්ටක්කුළිය ''මව් සෙවන'' නිවාසයේ දරුවන් වෙනුවෙන් සුහද හමුවක් පවත්වා ඔවුන්ට ත්‍යාග පිරිනැමූහ. **රසිකා ජයමිණි**




මෝසෙස්
ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
22
චිත්‍ර කථා රචනය ආනන්ද කල්දේරා.
දෙබස් හා චිත්‍ර ඇස්. ඒ. පී. ස්වර්ණාරච්චි
ටික කාලත් ගතවිය... මෝසෙස් ජෙත්‍රෝගේ එක් දියණියක් වන සිප්පෝරාව විවාහ කරගත්තේය...
එහෙත් ඊශ්‍රායල් ජාතිකයන් විඳින දුක ඔහුගේ හදවතේ පතුලේම තැන්පත්ව තිබුනි.. ඔවුන්ව ඒ වහල් භාවයෙන් මුදාගන්නේ.. කෙසේදැයි ඔහු නිතරම කල්පනා කරන්නට විය...
දිනක් මෝසෙස් සිය බැටළු, එළුවන් දක්කාගෙන.. මිදියන් දේශයේ.. සීනායි කන්ද අසලට ...යමින් සිටියේය......
ඕහ්.. මොකක්ද අර කන්ද මුදුනෙන් විහිදෙන එළිය.. කන්ද මුදුනට ගිහින් බලන්න ඕනි...
මෝසෙස් සීනායි කන්ද මුදුනට.. නැගියේ..
එහිදී දුටු දසුනෙන් මෝසෙස් විශ්මයට පත්විය..
ඕ!
ඕ.. අර පඳුර ගිනිගන්නවා නේද.. මහ ගිනි ජාලාවක්.. ඒත් පඳුර පිච්චෙන බවක්නම් පේන්න නැහැ..
හොඳට බලාගන්න තව ටිකක් ළඟටම යන්න ඕනි.
ඔහ්

# ළමා ප්‍රදීපය



















## ලෝක ළමා දින සැමරුම

හැඳල එකමුතු සමිතිය සිය 150 වැනි සංවත්සරය නිමිති කරගෙන වාර්ෂිකව සමරණ ලෝක ළමා දිනය මෙවර උත්සවශ්‍රීයෙන් නායකකන්දේදී සමරණු ලැබුවා. ජූඩ් මෙනේරපිටිය පදනමේ අනුග්‍රහයෙන් පැවැත්වූ මේ සඳහා ප්‍රදේශයේ පෙර පාසල් රාශියක දූ දරුවන් සහභාගී වනු ලැබුවා. නැටුම් ගැයුම් ක්‍රීඩා හා තරඟ රාශියක් මෙහිදී පවත්වන්නට යෙදුනා.

**ඡායාරූප : තිළිණ අලහකෝන්**









